

## වසත් ගීතය

වීණාවේ තත්
සුසර කරමින්
එදා ඔබ ගැයූ
වසත් ගීතය

වසන්ත, ගිම්හාන
සරතයේ මෙන්ම
සිසිරයේදී ද
නොවෙනස්ව

රස විඳිමි මම

**මාලතී රූපිකා**

## බක් මහේ වැස්ස ළඟ

හිමි අහිමි මතක මැද
බොහෝ කල් ගත වුවත්
බක් මහේ වැස්ස යට
මඳක් නවතිමි අදත්

අකුණු හඬ වියැකෙද්දි
වදන් ගොළු වී ගියත්
ළංව යළි දුරස් වුණ
සිහිවටන ඇත තවත්

**මල්කා රත්නතුංග**

## ඔබ ඇවිත්

ඇවිත් දිගු කලකින්
ඔබ දකින්නට මාව
එදා සමුගත් තැනට
මම ආස සුදු රෝස
පොකුරක් ද අරගෙනම
පැමිණ ඔබ සිපගන්න
උණුසුමේ දැවටෙන්න
බොහෝ දේ කියවන්න
බැරිව මා ළතැවෙද්දී
තබා මල් පොකුර එහි
ඔබ ගිහින් නොකියාම

**අමිතා පද්මකුමාරි**

## වෙද සිසුවාට ප්‍රථමාධාර

පළමුවැනි ආදරේ
හෙදියකට දුන්නාට
පෝරුවට ගෙන ගියේ
වෙද සිසුවියක් දිනෙක

වෝර්ඩ් එක පුරා අද
රිදෙන හිත සඟවන්න
වේදනාවට තිබුණු
ඖෂධය ආදරය

නයිටිංගේල් තාරකාව
සායනයක හැමදාම
නිවි නිවී දැල්වුණාම
වෙද සිසුවාට ප්‍රථමාධාර

**සුධර්මා සමරසේකර**

## මංගල කිංකිණී

හිතේ කකියන
හැඟුම් පොදි බැඳ
සුසුම් හෙළුවත්
රැය පුරා

තනිව හෙළනා
සෝ සුසුම්වත්
නොදුටුවේ ඇයි
මල්සරා

වසත් සමයේ
ප්‍රේම නොකරම
හැඟුම් කල් යයි
හිත හිතා

අදත් බැලුවා
මනාලියෝ මම
පුවත්පත්වල
පිටු පුරා

**තිලිණි නිසංසලා**

## මැදියමේ හීතල

වදන් රස මී මවන
ඔය හිතේ පෙම්බර
හැඟුම් නෙක තවරමි
රසයෙන්ම මත්වන

උවමි ගෙන සිත්කලු
නුඹ මැව්ව කවිපද
ළඟ නතර මගේ හිත
ගෙත්තම් ය හැමවර

පිනි මෝදු වන විට
මැදියමේ හීතල
සුදුපාට ඔය හිතේ
පුබුදුවමි තරු හිත

**මනෝජ් ප්‍රසන්න**

## අප්‍රේල් හිරු එළිය

මොන මාසයක් ද මේ
දිගටි ලෙමන් පළුවක්
සිරි සිරි මිරිකෙන'
කුඩා පැඟිරි දහවල

සුදු අසෝක
වීදුරුවට ලිස්ස
ලිස්සා වැටෙන

එක ම ඇඳුම
ඇඳ පැලඳ ගත්
දුඹුරු පශ්චාත්තාපය ම
ලුණු කඳු දිග රූට රූටා
ගිනි කූරු දලු නැඟී
දෙතොළග ගෑවෙන

යළි යළිත්
ඇටමිදුලු කකියන විට
මා' සොවින් තැවෙමින්
හඬන.!

කෙහෙරැලි බැඳී
වෙල්වට් රිබන් පටියක්
දා' බිඳෙන් බිඳ තෙත් වෙයි
සොළොස් විය
තරුණියකගෙ කෝමල
සිනහව මෙන්

සුපෙම්වත!

ඔබ මතකයට නැඟෙන
උමතු තත්පර කටුවේ
මිමිණුම් නද මැදින්
ගුළිවෙන..

ඒ මොළොකැටි
වලාකුළු තරණයෙ
ඇවිද යන්නට

මා යටි හිතෙ
කෙටි සිහින ද
මේ' තරම්
එතෙමින් ද
උස් ව පළල් ව

විදුරු දාරයෙ ඉසියුම්
නටන උණු බුබුළු මත
යළි යළිත් මිරිකෙන

මේ කහ පැහැති
අප්‍රේල් හිරු එළිය

**ෂෙහානි ප්‍රනාන්දු**

## සොඳුර

මේඝ දූතයක් ලීවත්
ඔබට ආදරෙන්
ලියූ ගීත මැකී ගියේ
අළු වලාකුළෙන්
වසන්තේ නිමා කරන්
ඉඩෝරෙකට මං තනා
මැකී ගොස් ඔබත් අද
තුටු ගිගිරි සොය සොයා
බිඳුණොතින් කවද හෝ
ඔබෙ හදත් මගෙ ලෙසින්
සොඳුර,
බලනු මැන යළි හැරී
මන් තාම මඟ බලන්

**දිල්ක රවිහාර**





# වසත් සුළඟ

kavi.dinamina@lakehouse.lk

**ලිපිනය - අංක 35,
ඩී.ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.**

**සංස්කරණය - රජිත බස්නායක**

## මේඝ චිත්‍ර සිතුවම

ඒ වලාකුළ හරිම සුන්දරයි
විටින් විට නෙක විදි වර්ණ රටා මැවෙයි
වර්ණ සංකලනය හරිම අපූරුයි
මලෙව්ගෙ සුන්දර ලොව වගේමැයි

මල් හී තුඩින් හීරුණ සිත කුළුගැන්වී
කුලුඳුල් පෙම් සිතුම් තෙළි තුඩෙහි දවටා
ඇන්දෙමි අර වලා පටල මැද
සුන්දර වූ සිතුවමක් අපමණ සෙනෙහසින්

ඒ සුන්දර සිතුවම උපුටා ගත්තේ
මගේ හද සිදුරු කළ මල් හීයේ අන් කෙළවර
ඇමිණී මියුරු වේදනාවකින් සැලෙමින් පැවති
හදවතෙහි අනුරුව අනුකරණයෙනි

සිතුවම දෙස නෙතින් නොව සිතින් බලමින්
විඳිමින් සිට කල්පයක් මෙන් දැනුණ කාලයක්
ඇතුළු ගෙට වැඩමවන්නට සූදානම් වීමි
අර සිතුවම දෑඟිලි පටලවාගෙන

මෙවිට සැණෙක පිපිරෑ හෙණ හඬකින්
තිගැස්සී බැලුවෙමි අහස දෙස
වලාකුළ අඳුරුව කළුවර වීගෙන
ගලා හැලෙයි මහ පොළවට අර සිතුවම බොඳ වී

**ගාමිණී ලිවේරා**

## මට එන්න හිතෙනවා

නුඹ නොදැක ගතවෙන මේ
අවසාන තත්පර හරි දිගුයි
නෙතු දැවෙනවා රුව සොය සොයා
හිත කියනවා යළි එයි කියා

නෑ ළංව ඉන්නට වරම් හිමි වී
ලෝකයේ ගැරහුම් නිසා
නෙතු මානයට විත් පෙනී නොපෙනී
ඉන්න වෙනවා හිත හදා

සඳ කිනිති ගිලිහෙන රැය මුළා කර
විහඟ තටුවක සැඟවිලා
මට එන්න හිතෙනවා ආයෙ දවසක
නුඹෙ වෙන්න ලොවටම හොරා

**නිලූකා පතිරණ**

## රතු රෝස

රවි ඈ දෙස බලා සිටිනා විටදී
විකසිත වෙයි ඇයගේ වත පිබිදී
ඇය සිපගන්ට මා සිතනා විටදී
සුවඳට ඇගේ මගෙ සිත ඇත පිබිදී

ඇය සුන්දරයි සුකුමාලයි හැඩකාරයි
ළංවී බලන්නට මා සිත දඟකාරයි
රොන් ගන්නට බඹරෙකු එහි ගැවසෙයි
නෙළන්නට සිතෙයි ඈ එනමුදු තරුණයි

**සුමිත් රූපසිංහ**



## "සුන්දර සිරිය කොක්මාදුව පිවිසීම"

කලකට ඉහත මතකය යළි පිවිසීම
නෙත් සිත් වසඟ කළ තැන් ඇති ඉඳුරාම
මල් මල් සිහිනයකි අමතක නැති තාම
සුන්දර තැනකි කොක්මාදුව පිවිසීම

නිල් මානෙල් නෙළුම් මල්වල සුවඳ දැනී
සියොතුන් පෙළක් යුද මෙහෙයුම කරනු වැනී
ගව මී කිඹුල් වානර රඟ දුරට පෙනී
විල් දිය මල් මතින් මාළුවෝ උඩට පනී

වතුසුදු පින්න බෝවිටියා මල් පිපෙන
හිමිකම් නොමැති වැල වරකා සුවඳ දෙන
මඟ යන එන අයට සිසිලස සුවඳ වුණ
නන්දන උයනකිය කොක්මාදුව අරණ

පොල්අතුමෝදරින් සිසිලස, සෙවණ ගෙනා
ගොවිබිම් රන් කරල් බර වී නැඟුණු සිනා
රුහුණේ වන සිරිය සම්පත සතුට අනා
අධි වේගයෙන් මතකය සිහියට නැඟුණා

**රුවන් බොරලැස්ස**



## පෙම්වත් නුවර

මහ වැව දිහා
බල බල ඒ අහස යට
මහ මඟ වැටුණි
මල් පාවඩ මඟ දිගට
මහ ඉඩ නැතත්
ඒ මහ තුරු ගොමුන් වට
මහමෙර ලෙස
නිවුණි මං
ඒ මහනුවර යට

**මොනිකා ඉලංගසිංහ**

## කැලයේ මල් සුවඳ

නිහඬයි ශාන්තයි වතුකරයම අවට
තැන තැන පෙනෙයි අඩි සලකුණු මට දුරට
දහදිය කඳුළු පැල්ලම් මුසු වී ඝනට
මේ අඩි පාර තවදුරටත් නෑ සුමට

හෙල් තැනිතලා ගිරි දුදුළු ද වන වියන
කල් යල් බලා කවියට දුන්නෙම කසිණ
මුල් සොය සොයා හාරන්නට හිත කියන
කරගැට පිරුණ අතැඟිලි සුවඳක් නැඟිණ

නමක් නොදන්නා කැලයේ මල් සුවඳ
ඇවිත් බලන්නට හිතුණොත් හෙට නිබඳ
තවත් පමා වන්නට කාරණ කිමද
කවක් වෙලා නවතින්නට යමු සබඳ

**නයෝමී අමරසිංහ**



## ජම්බු රත

කජු මලී අඹ මලී
බිම දිගට හැලි හැලී
කන්ද බැස ළන්ද දිග
ගලා යයි ගඟුලැලි
ජම්බු රත පොරව ගෙන ගෙමිදුලේ
සැරසිලි
විහඟ කූඩුවෙ දොරෙන්
ඇසෙයි ගී නැළවිලි

අඹ ඉදී ලෙහෙනුන්ට
රජ මඟුල් මේ දොහේ
ගිරව් රෑණක් ඇවිත්
දොඩමළුවෙ රඟ ඇහේ
කොහෙකු අතු උඩ ඉඳන්
පාන්දර සිට නැහේ
අවුරුද්ද අවුරුද්ද රබන්
රත්වෙයි මෙහේ

**මහගම සීලානන්ද හිමි**